
නිවාඩු කාලීන පැවරුම - සිංහල භාෂාව හා සාහිත්‍යය - 6 ශ්‍රේණිය

නලපාන ජාතකය - 8 වන පාඩම





- කුරුණෑගල යුගයේ රචනා වී ඇත.
- බහුකර්තෘක කෘතියකි (කතුවරයන් රාශියකි )
- බුදුන් වහන්සේගේ පූර්ව ජන්මය පිළිබඳව කතා පුවත් ඇතුළත් ය.
- ඇතුළත් කතා සංඛ්‍යාව 547 කි
- දහයේ ගුණාකාර සලකා 550 ලෙස පිළිගැනෙයි.

## නලපාන ජාතකය

තේමාව : බුදුරජාණන් වහන්සේගේ පෙර ආත්ම භාවයෙහිදී වඳුරු නායකයෙකු ලෙස කටයුතු කළ ආකාරය

සිය වානර සමූහයාගේ ජීවිත දිය රකුසාගෙන් බේරා ගැනීමට වඳුරු රජතුමා ප්‍රඥාවන්තව කටයුතු කළ ආකාරය මෙම කතා පුවතෙන් කියවෙයි.




ජාතක කතාව අවස්ථා තුනකි.

1 වර්තමාන කතාව

2.අතීත කතාව

3. සමෝධානය

ආදරණීය දුවේ / පුතේ. ඔබට නියමිත පෙළපොතේ ඇති පාඩම ඡේදයෙන් ඡේදය අරුත් විමසමින් ජාතක කතාවේ කොටස් තුන අධ්‍යයන කිරීමට අපි දැන් බලමු. මේ සඳහා ඔබගේ පෙළපොත 51 වන පිටුව පෙරළා ගන්න.

# අතීත කතාව .................................

ආරම්භක ඡේදය .......තවද එක් සමයෙක්හි දෙව් බඹුන් මුදුනෙහි කෙළනා පා පියුම් ඇති ලෝකස්වාමි වූ සර්වඥයන් වහන්සසේ කොසල් දනව්වෙහි සැරිසරා ඇවිදිනා සේක්.නලපාන නම් ගමට පැමිණ නලපාන පොකුණ සමීපයෙහි වූ වැටකේ වනයෙහි වසන සේක් බට දඬු අරභයා මේ ජාතකය වදාළ සේක..................

අතීත කතාව :තවද, එක් කාලයක දේව බ්‍රහ්ම ආදින් හිස මුදුනෙහි පාතබා වන්දනා කරනු ලබන , ලෝකයට ප්‍රධාන වූ බුදුරජාණන් වහන්සේ , කෝසල ජනපදයෙහි ඇවිද නලපාන ගමට වැඩම කර , නලපාන පොකුණ අසල වැටකේ වනයක වාසය කරන කළ, එකල බට දඬු මුල්කොට මේ ජාතකය වදාළ සේක.

# වර්තමාන කතාව :..........................

එසමයහි භික්ෂූන් වහන්සේ නලපාන නම් පොකුණෙන් පැන් සනහා ඉදිකටු කුළා නිසා සාමණේරයන් වහන්සේ ලවා බට දඬු කප්පවා ගෙන්වා ගෙන ඒ සියලු බට දඬු ගැට නැතිව ඒකච්ඡිද්‍රව දිගටම සිදුරු නියාව දැක බුදුන් කරා ගොස් ...................................වදාරා ඉකුත් වත් දක්වා වදාළ සේක .(ඡේදයේ මුලහා අග පමණක් දක්වා ඇත. පෙළපොත බලන්න _)

ඒ කාලයේ භික්ෂූන් වහන්සේලා නලපාන පොකුණෙන් දිය නා , ඉදිකටු දැමීමට සාමණේර වහන්සේලා ලවා බට දඬු කප්පවා ගෙන්වා ගත් විට , එම බටදඬුවල ගැට නැතිව එකම සිදුරක් ලෙස තිබෙනු දැක බුදුරජණන් වහන්සේ කරා ගොස් , ඒ බව කීහ. එසේ වුයේ කුමක් නිසාදැයි ඇසූ කල "මහණෙනි , අතීතයේ කළ මාගේ අදිටනකැයි කීසේක. එසේ වූ කතාව පැහැදිලි කිරීමට කතාව දේශනා කර ඇත.

(ආරම්භය )යටගිය දවස එවන වන ළැහැබ වල් වුයේය.................. (අවසානය )විරූ පැනක් බොතොත් වේවයි මා විචාරා ම කව බොව "යි විධාන කළෝ ය.........................................................



අතීතතයේ ඒ කැලය , ගසින් පිරී තිබුණි. පොකුණෙහි එක් දිය රකුසෙක් පොකුණට බසින මිනිසුන් කයි. එකල බෝධිසත්ත්වයන් වහන්සේ ද , තිත් මුවෙකු තරම් මහත වූ වඳුරු රජ ලෙස අසූ දහසක් පමණ වඳුරන් පිරිවරා ගති. වානර සමූහයට අවවාද දුන් සේක. "මෙහි විෂගස් ඇත. අමනුෂ්‍යයන් අධිගෘහිත (අරක්ගත් ) පොකුණු ඇත. ඒ නිසා තොප හැමදෙනා , පෙර නොකෑ පලතුරු ගෙඩියක් කෑමට පෙර ද, පෙර නොබී ඇති තැනක ජලය බොන්නට පෙරද,, මගෙන් අසව " යි අණකළ සේක.

(ආරම්භක ඡේදය _) ඒ වානරයෝත් එබස් යහපතැයි පිළිගෙන එක් දවසක් පෙර නොගිය විරූතැනකට ගොස් එතැන්හි ..........................(අවසානය ).බෝධිසත්ත්වයන්ගේ ඊම බලා උන්නාහුය

ඒ වානරයෝ ද "හොඳයි " කියා ඒ අණ පිළිගත්තේ ය. එක් දවසත් කලින් නොගිය තැනකට ගොස් , දහවල ඇවිද ජලය සොයන විට , එක් පොකුණක් දැක දිය නොබීම බෝසතුන් එනතුරු බලා සිටියෝ ය.

එතැනට පැමිණි බෝසත්තුමා :-----------------

බෝසත්තුමා : කිමෙක්ද ? දරුවෙනි, පැන් නොබොව් දැ" යි කිවු ය

: ඇයි ? දරුවෙනි දියනො බොන්නෙහි දැ යි

වඳුරන් : නුඹ වහන්සේ එන තෙක් බලා උනුම්හ "යි කිවුය

: නුඹ වහන්සේ එනතුරු බලා සිටියෙමු "යි කිවෝ ය.

බෝසත්තුමා : "දරුවෙනි තොප කළ දේ යහපතැ "යි කියා පොකුණ සිසාරා ඇවිද පියවර පරීක්ෂා කරන්නා හ.

: දරුවෙනි ඔබ කළ දෙය හොඳයි කියා පොකුණ වටා ඇවිද පා සටහන් පරීක්ෂා

කළහ. (පොකුණට බැස ගිය පා ලකුණු මිස , ගොඩට ආ පා සලකුණු නොදැක

, ඒකාන්තයෙන් ම මෙය අමනුෂ්‍යයෙකු විසින් අයිති කර ගත් පොකුණක් වේ.



(ආරම්භක ඡේදය ) උදක රාක්ෂයාද ඒ වඳුරන් ...........දිය දෙබෑ කොට නික්ම................

උදක රාක්ෂයාද වඳුරන් ජලයට නොබසිව බව දැක, නිල් වූ බඩ, සුදුපාට කට හා රතුපාට අත්ල පත්ල ඇතිව භයානක වෙස් ගෙන දිය දෙ බෑ කොට මතු වී .......

කුමක් නිසා උනු ද..................... (ආරම්භක ඡේදය )

රකුසා : මොකද? බලා ඉන්නේ පොකුණට බැහැලා බොන්න.

බෝධිසත්ත්වයෝ : මේ පොකුණෙහි උපන් උදක රාක්ෂසයා නම් තෝදැ යි

මේ පොකුණේ උදක රාක්ෂයා නුඹ ද ?

රකුසා : එසේ ය මම ය. ( ඔව් මම )

බෝධිසත්ත්වයෝ : පොකුණට බටවුන් කන්ට ලැබෙන්නේ දැයි................ විචාළෝ ය

බෝධිසත්ත්වයෝ :පොකුණට බසින අය කන්ට හැකි ද? ඇසුවේය.

රකුසා : එසේය ලබමි ..මම මීට බට යටත් පිරිසෙයින් පක්ෂීන් පටන් කිසි කෙනෙකු නොහරිමි. තොප හැමදෙනාත් කන්නෙමි

රකුසා : ඔව් , කන්න හැකියි. මෙයට බසින කුරුල්ලෙකුගේ පටන් කිසි කෙනෙකුන් අත් නොහරිමි , උඹලා හැමදෙනාමත් කනවා....

බෝධිසත්ත්වයෝ : අපි තොප විසින් අප හැම දෙනා කෑ නොදෙම්හ යි

අප හැමදෙනාම නුඹට කන්න දෙන්නේ නැත

රකුසා : එසේ කල පැනුත් බොන්නෙව් දැ එහෙම නම් දියත් බොනව ද?


බෝධිසත්ත්වයෝ : එසේ ය පැනුත් බොම්හ. තොප වසඟයටත් නොපැමිණෙමි.

ඔව් දියත් බොන්නෙමු. උඹට යටත් කරගන්නට නොදෙන්නෙමු.

රකුසා : එසේ කල කෙසේ පැන් බොව් .......එහෙමනම් දිය බොන්නේ කොහොම ද?

බෝධිසත්ත්වයෝ : කිමෙක් ද ? තෝ බැස පැන් බොති යි සිතන්නෙහි දැ.....අපි හැම අසූ දහසක් පමණ වඳුරෝ පොකුණට නොබැස ම එකී එකී බට දණ්ඩක් ගෙන ඇඹුල් දණ්ඩෙන් පැන් බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොම්හ එසේ කල්හි තොප හැමදෙනා අප ක්නට අසමත් වන්නෙහි

ඇයි ? පොකුණට බැස දිය බොන්නේ යැයි සිතනවා ද? අප අසූ දහසක පමණ වඳුරන් හැමදෙනා , එක් එක් බට දණ්ඩක් ගෙන සුදු මහනෙල් දණ්ඩකින් පැන් බොන්නා සේ උඹේ පොකුණෙන් පැන් බොන්නෙමු. එසේ කළ විට උඹට අප හැම කන්ට නොහැකි වේ ...



මෙසේ කියා මහා බෝසතාණෝ.....(52පිටුව

මෙසේ එක් බට දණ්ඩක් ගෙන්වා ගෙන, පාරමී ධර්මය සිහිකො සත්‍ය ක්‍රියා (අදිටන ඉටුවේවයි )සිතා කටින් පිම්බෝ ය. බට දණ්ඩෙහි එකම ගැටයක් නැතිව මුල සිට අග දක්වා සිදුරු විය. මේ ලෙස අනික් බට දඬුද පිඹ දුන්නෝ ය. පිඹිමින් ඉවරයක් කරන්නට බැරි නිසා , බටවල ගැට නැතිවේවා යි අධිෂ්ඨාන කළෝ ය.

බෝධිසත්වවරයන්ගේ කුසල් මහත් බැවින් (ආරම්භය).........................බෝසතුන්ගේ පින විශාල බැවින් සිතූ දෙය ඉටු වෙයි. එදා පටන් ඒ පොකුණ වටා වැවෙන සියලු බට දඬු ගැට නැති වෙයි
.

මේ කල්පයෙහි කල්පස්ථායික වූ ප්‍රාතිහාර්ය සතරෙක් වන්නේය..............................

මේ කල්පයෙහි පවතින හාස්කම් හතරක් හැත. ඒවා නම්

චන්ද්‍රයාගේ ශශ ලාඤ්ඡනය ද සඳෙහි හාවාගේ ලකුණු තිබීම ද,

වට්ටක ජාතකයෙහි ගිනි නිවිගිය තැන් මේ කප මුළුල්ලෙහි ගින්නෙන් ...

වට්ටක ජාතකයෙහි ගිනි නිවී ගිය දා පටන් , කල්පය පුරා ගින්නෙන්න නොදැවීම ද,

ඝටීකාර නම් කුම්භකාරයාගේ ගෙය පිහිටි තැන් සියලු මේ කප නොතෙමී තිබෙන්නේ ය.

ඝටීකාර නම් කුඹලාගේ ගෙය පිහිටි තැන මේ කල්පය පුරා නොතෙමී තිබීම ද,

මේ පොකුණ පිරිවරා සිටි සියලු බට දඬු මේ කප මුළුල්ලෙහි ඒකරන්ධ්‍රව තිබෙන්නේ

මේ පොකුණ වටා සියලු බට දඬු ගැට රහිත වීම ද , යන කරුණු හතර විය.

බෝධිසත්ත්වයෝ මෙසේ අධිෂ්ඨාන කොට ....................................(ආරම්භ පේළිය )




එසේ අදිටන් කොට බෝසතුන් වහන්සේ එකබට දණ්ඩක් ගෙන සිටි විට අනෙක් අසූ හාරදහසක් වඳුරන් ද, බට දඬු ගෙන, ගොඩ සිට දිය බොන්නට හැකි විය. මෙසේ හැම දෙනාම ගොඩ සිට දිය බීවාට පසු , උදක රාක්ෂයා අසතුටු සිතින් තම වාසස්ථානයට ගියේ ය. බෝසතාණෝ තම පිරිවර සහිතව කැලයට ගිය හ.

# සමෝධානය ( අතීතය හා වර්තමානය ගැළපීම )

ශාස්තෘ වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ....................... (ආරම්භ පේළිය )

බුදුරජාණන් වහන්සේ , “මහණෙනි, මේ බට දඬු සිදුරු රහිත වීමට හේතුව මාගේ අතීත අධිෂ්ඨාන යයි. බණ දේශනා කර පෙර අපර (අතීත වර්තමාන _) සම්බන්ධය ගැන විස්තර කර නලපාන ජාතක නිම කළ සේක.............................

දුවේ/පුතේ දෙමව්පිය සහාය ඇතිව මෙය ඔබේ සටහන් පොතේ ලස්සනට ලියාගන්න. පෙළපොතේ ඇති අරුත් පැහැදිලි කිරීම් ද ලියන්න.

අවබෝධය හා ලිඛිත අභ්‍යාස සඳහා ද පිළිතුරු ලියන්න. ඔබ ලියූ පිළිතුරු නිවැරදිද යන්න පරීක්ෂා කර ගැනීමට ඉදිරි දිනකදී පිළිතුරු මේ ආකාරයෙන්ම ඔබ වෙත එවමි.

එච්.එම්.සී.දර්ශනී හේරත් මිය ......මිනු /ශ්‍රී ඥානාවාස ම.වි. - සිංහල අංශය

DARSHANI HERATH